
## සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
### නිවාඩු කාලීන පැවරුම් - 5 ශ්‍රේණිය - පරිසරය
මාවනැල්ල අධ්‍යාපන කලාපය

සැකසුම ඃ නන්දනතිලක අලුත්ගම කෑ/මාව/ මයුරපාද ජාතික පාසල


# 8 - තේමාව - ජලය

★ පහත දැක්වෙන සරල පරීක්ෂණ නිවසේ සිට සිදුකර බලන්න.

1 පරීක්ෂණය




වතුර වීදුරුවක් ගෙන එයට නිල්පාට තීන්ත බිංදු කීපයක් දමා කළවම් කර ගන්න. අනතුරුව නිල් පැහැ ජල බඳුනට අයිස් කැටයක් දමන්න. ටික වේලාවකින් අයිස් කැටය දියවී බඳුනේ ජලය සිසිල් වේ. එම සිසිල් බව වීදුරුවේ පිට පැත්තට ගමන් කර වාතයේ ඇති ජලය ජල බිංදු ලෙස වීදුරුව වටා තැන්පත් වී ජල බිංදු ලෙස පහළට රූරා වැටේ.

01. මේවාට පිළිතුරු සපයන්න.

1. බඳුනේ ජලය සිසිල් වූයේ ඇයි ? ..........................................................................
2. වීදුරුවේ ජලය පිටතට කාන්දු වූයේද ? .................................................................
3. වීදුරුවේ පිටත ජල බින්දු කුමන පාටද ? ...............................................................
4. වීදුරුව පිටත ජල බින්දු ඇති වූයේ කෙසේද ? ....................................................

(ලකුණු 8)

2 පරීක්ෂණය




උස ප්ලාස්ටික් බෝතලයක් ගෙන රූපයේ දක්වා ඇති ආකාරයට සිදුරු තුනක් විදින්න. ලොකු භාජනයකට වර්ණවත් ජලය පුරවා බෝතලයට වත් කරන්න. එක් එක් සිදුරෙන් ජලය පිටවන වේගය නිරීක්ෂණය කරන්න. බෝතලයේ පතුලේ ම ඇති සිදුරෙන් ජලය වැඩි දුරකට ද, මැද සිදුරෙන් තරමක් මද දුරකට ද, ඉහළම ඇති සිදුරෙන් අඩු දුරකට ද ජලය විදින බව අවබෝධ වෙයි. මෙසේ සිදුවන්නේ ජල බඳුනේ පතුලේ පීඩනය වැඩි බවත්, ඉහළට යත්ම පීඩනය ක්‍රමයෙන් අඩුවන බවත්ය.

02. පහත ප්‍රශ්න හරි නම් හරි (✓) ලකුණද, වැරදි නම් වැරදි (✗) ලකුණද වරහන් තුළ යොදන්න.

1. බඳුනේ පතුලේ සිදුරෙන් වැඩි දුරකට ජලය විදියි. ( )
2. ජලය විදීම මුලින්ම නතර වන්නේ මැද ඇති සිදුරින්ය. ( )
3. ජලාශයක පීඩනය වැඩියෙන්ම ඇත්තේ වේල්ල මතුපිටය. ( )
4. ජලාශයක වේල්ලේ පාමුල පළලින් වැඩිය. ( ) (ලකුණු 8)

3 පරීක්ෂණය



රූපයේ ඇති ආකාරයට සමාන වීදුරු දෙකක් ගෙන එක් වීදුරුවකට පිරිසිදු ජලය 200ml ක් ද, අනෙක් වීදුරුවට ලුණු තේ හැදි 10 ක් දමා ජලය 200ml ක් සමඟ කළවම් කර ගන්න. ප්‍රමාණයෙන් සමාන බිත්තර 2 ක් ජල වීදුරු දෙකට දමා නිරීක්ෂණය කරන්න. පිරිසිදු ජල වීදුරුවේ ඇති බිත්තරය යට යන අතර ලුණු මිශ්‍ර ජල වීදුරුවේ බිත්තරය පාවෙන අයුරු පෙනේ. ඒ අනුව සාමාන්‍ය ජලය (මිරිදිය) ට වඩා ලුණු මිශ්‍ර ජලයේ (කරදිය) ද්‍රව්‍ය පාවීම වැඩිය.

03. මේවාට පිළිතුරු සපයන්න.

1. පිරිසිදු ජලයට බිත්තරයක් දැමූ විට කුමක් සිදුවේද ? ............................................
2. ලුණු මිශ්‍ර ජලයට බිත්තරයක් දැමූ විට කුමක් සිදුවේද ? ............................................
3. පාවීම වැඩි සාමාන්‍ය ජලයේ ද, ලුණු මිශ්‍ර ජලයේද ? ............................................

(ලකුණු 3)

04. ජලය දූෂණය වන ක්‍රම මොනවාද ?

1. ............................................ 4. ............................................
2. ............................................ 5. ............................................
3. ............................................

(ලකුණු 10)

05. ජලය පිරිසිදු කර ගැනීමට අතීතයේ හා වර්තමානයේ යොදාගත් ක්‍රම ඇසුරින් වගුව සම්පූර්ණ කරන්න.

| අතීතයේ භාවිතා කළ ක්‍රම | වර්තමානයේ භාවිතා කරන ක්‍රම |
|---|---|
| | |
| | |
| | |

(ලකුණු 12)

06. පහත දැක්වෙන ජලය හා බැඳුණු සාම්ප්‍රදායික සිරිත් විරිත් කුමන ආගමික කොට්ඨාශයටකට අයත් දැයි තෝරා යා කරන්න.

| | |
|---|---|
| 1. සංඝයා වහන්සේලාගේ පා දෝවනය | බෞද්ධ |
| 2. කුම්භාභිශෝතම් හෙවත් දෙවිවරු නැවීම. | |
| 3. මිය ගිය මෘත දේහ නැවීම | හින්දු |
| 4. දරුවන් බෞතීස්ම කිරීමේදී ප්‍රසාද ස්නාපනය | |
| 5. ආශිර්වාද සඳහා පිරිත් පැන් යොදා ගැනීම. | ඉස්ලාම් |
| 6. ආගම ඇදහීමට පෙර පිරිසිදුවීම. | |
| 7. මරුත්තුනීර් දමා ස්නානයක කිරීම. | කතෝලික |

(ලකුණු 7)

07. ගං වතුර තත්ත්වයකදී සිදුවන ආපදා මොනවාද ?

1. .............................................. 3. ..............................................

2. .............................................. 4. ..............................................

08. අපේ රටේ ගං වතුර ආපදා බහුල දිස්ත්‍රික්ක කීපයක නම් ලියන්න.

1. .............................................. 3. ..............................................


2. .............................................. 4. ..............................................

(ලකුණු 10)

## ජල පෙරණයක් සදමු.

ලොකු ප්ලාස්ටික් බෝතලයක් දෙකට කපා උඩ කොටස පහළට හරවා, පූනිලයක් ලෙස සකස් කර ගන්න. එහි කට ආවරණය වන ලෙස පුළුන් ගුලියක් සිර කරන්න. ඉන්පසු පිළිවෙලින් සිහින් වැලි, රළු වැලි හා ගල් බොරළු තට්ටු ලෙස අසුරා ගන්න. අනතුරුව බොර පාට ජලය ඉහළින් වත් කරන්න. ජලය පිරිසිදු වී පැහැදිලි ජලය පිටතට එන අයුරු නිරීක්ෂණය කරන්න.

09. පහත ජල පෙරණයේ A, B, C, D, E ලෙස දක්වා ඇති දේවල් නම් කරන්න.




A ..............................................

B ..............................................

C ..............................................

D ..............................................

E ..............................................

(ලකුණු 10)

10. ජී.බී. අල්විස් පෙරේරා රචිත 'මගේ රට' කවි පන්තියේ පහත කවිය සම්පූර්ණ කරන්න.

මහවැලි කැලණි කළු වලවේ යන ගංගා




.................................................... ..........................

.................................................... ..........................

.................................................... .......................... (ලකුණු 6)

11. පහත ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. ජලයට දැමූ අයිස් කැටයක් නිවැරදිව පෙනෙන ආකාරය වන්නේ,

1.  2.  3. 

2. යාපනය ප්‍රදේශයේ වැසියන් ජලය ලබා ගැනීමට බහුලව යොදා ගන්නේ,

1. ආඬියා ළිං 2. නළ ළිං 3. පීල්ල

3. ජල වාෂ්පවලින් තම්බා සකස් කර ගන්නා ආහාරයක් නොවන්නේ කුමක්ද ?

1. ආප්ප 2. හැලප 3. පිට්ටු

4. අයිස් කැටයක් වඩාත් ඉක්මනින් දිය වන්නේ,

1. ඇල් ජලයේ 2. ශීතකළ ජලයේ 3. උණු ජලයේ

5. වඩා ලාබදායි විදුලිය නිපදවීමේ ක්‍රමයකි,

1. ජල විදුලි බලාගාර 2. ඉන්ධන බලාගාර 3. ගල් අඟුරු බලාගාර

6. ජල රෝදය කැරකෙන වේගය වැඩි කර ගැනීමට කළ හැක්කේ,

1. ජල පහරේ උස අඩු කිරීම.

2. ජල රෝදයේ පෙති ගණන වැඩි කිරීම.

3. ජල රෝදයේ පෙති ගණන අඩු කිරීම.

7. සුබ කටයුත්තකට යන විට වතුර වීදුරුවක් ගත් කාන්තාවක් ඉදිරියට ඒමේ චාරිත්‍රය කරනු ලබන්නේ,

1. සිංහල ජනතාව 2. ද්‍රවිඩ ජනතාව 3. මුස්ලිම් ජනතාව

8. ලුණු නිපදවීමේ කර්මාන්තය සඳහා යොදා ගන්නේ,

1. මිරිදිය 2. කිවුල් දිය 3. කරදිය

9. වලාකුළින් බැස - සමන්කුළක් වැද.... හා එම්බා ගංගා නවතිනු..... ගීත රචනා කර ඇත්තේ,

1. කරුණාරත්න අබේසේකර 2. මහගම සේකර 3. අරිසෙන් අහුබුදු

10.දිනකට පානය කරන ජල ප්‍රමාණය අවම වීම නිසා හානිවන ශරීර අවයවයකි.

1. හෘද වස්තුව 2. පෙනහළු 3. වකුගඩු

(ලකුණු 20)

(පැවරුම - ජලය ගැන කියවෙන කවි/ ගී ඇතුළත් පොත් පිංචක් සාදන්න.)